2018.10.10

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

# අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ප්‍රගතිය හා කොමිෂන් සභාව මුහුණදෙන අභියෝග

වාර්තාව

2017 - 2018

2017 ජනවාරි මස 01 දින සිට 2018 ඔක්තෝබර් මස 10 දින දක්වා කාල පරිච්ඡේදය තුළ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් සිදු කරන ලද ප්‍රමුඛ කාර්යයන් පිළිබඳව මෙම වාර්තාවෙන් සංක්ෂිප්ත කොට දක්වා ඇත. එසේම තම සේවාවන් සිදුකිරීමේ දී කොමිෂන් සභාවට මුහුණ දීමට සිදුවන අභියෝග හා ගැටලු පිළිබඳව ද මෙහි දැක්වේ.

**A. අල්ලස් කොමිසමේ වගකීම** ……………………………………………..…. 03

**B. අල්ලස් කොමිසමේ ජයග්‍රහණ**

01. වරදකරු කිරීම් ගණන ........................................................................ 04
02. අල්ලස් වැටලීම් ........................................................................ 04
03. නඩු පැවරීම් ........................................................................ 04
04. ශ්‍රේණිගත කිරීම් ........................................................................ 05
05. ජාතික ක්‍රියාකාරී සැලැස්ම ..................................................................... 06
06. UNCAC බැදියාවන් ........................................................................ 06
07. UNODC පිළිගැනුම ........................................................................ 07
08. විවෘත රාජ්‍ය පාලන හවුල්කාරිත්වය ....................................................... 08
09. GSP + සහනය ........................................................................ 08
10. වෝහාරික විමර්ශකයින් බඳවා ගැනීම .................................................... 08
11. නිවාරණ නිලධාරීන් බඳවා ගැනීම .................................................... 08
12. නීති සංශෝධනය .................................................... 12
13. නිවාරණය ........................................................................................ 11
14. සුපිළිපන්න සැලැස්ම .............................................................................. 12
15. අධ්‍යාපනය ........................................................................................ 12
16. පුහුණු කිරීම් ........................................................................ 13
17. වෙබ් අඩවිය දියත් කිරීම ........................................................................ 13

**C. අභියෝග**

01. කාර්යාල ඉඩ හා අනෙකුත් පහසුකම් ප්‍රමාණවත් නොවීම............................ 14
02. අඩු වැටුප් ........................................................................................ 14
03. කාර්ය මණ්ඩල හිඟය ........................................................................15
04. නිලධාරීන් පුහුණු කිරීමට ප්‍රතිපාදන නොමැතිවීම .....................................15
05. විද්‍යුත් ක්‍රම භාවිතා කිරීමට ප්‍රතිපාදන නොමැතිවීම .....................................16
06. පොදු මහජනතාවගේ සාමාන්‍ය මතය.........................................................16

# A. අල්ලස් කොමිසමේ වගකීම

අල්ලස් කොමිෂන් සභාවේ කාර්යභාරය බහුවිධය. එය හුදෙක් විමර්ශනය කිරීම්, නඩු පැවරීම් හා පැමිණිල්ල මෙහෙයවීමෙන් ඔබ්බට යන කාර්යභාරයකි.

ඒ අනුව සාර්ථක විමර්ශනයන් සිදු කිරීම සඳහා වෘත්තීමය විමර්ශන නිලධාරීන් බඳවා ගැනීම, නිවාරණ ඒකකයක් පිහිටුවීම, රාජ්‍ය ආයතන සඳහා නිවාරණ ක්‍රමවේදයක් හඳුන්වා දීම, අල්ලස දූෂණය සම්බන්ධයෙන් ජනතාවගේ ආකල්පමය වෙනසක් ඇති කිරීම, එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ යුරෝපා සංගමයට යන ආයතනවලට නිරන්තර වාර්තා කිරීම් සිදු කිරීම යනාදිය ඇතුළත් වේ.

අපගේ මූලික පරමාර්ථය කෙසේ හෝ මහජනතාව පිනවීම සඳහා පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන අධිකරණය වෙත නඩුවක් ඉදිරිපත් කිරීම නොව ඉතාමත් සාර්ථක නඩුවක් ගොනු කොට පැමිණිල්ල සාර්ථකව මෙහෙයවීමයි. ඒ අනුව 2017, 2018 වර්ෂවල දී පිළිවෙලින් විත්තිකරුවන් 57 දෙනෙකු සහ 59 දෙනෙකු වරදකරුවන් බවට පත් කිරීමේ හැකියාව ලැබී ඇත.

# B. අල්ලස් කොමිසමේ ජයග්‍රහණ

කොමිෂන් සභාව වෙත පැවරී ඇති වගකීම ඉටු කිරීම සඳහා කොමිෂන් සභාව විශාල කාර්ය භාරයක් ඉටු කරමින් සිටී. සිය කර්තව්‍ය ඉටු කිරීමේ දී කොමිෂන් සභාව ලැබූ ජයග්‍රහණ ඉමහත්ය.

## 01. වරදකරු කිරීම් ගණන

a. 2017 වසර තුළ අවසන් කරන ලද නඩු විභාග 89 ක් තුළින් වරදකරු කරන ලද ගණන 57කි. මෙය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා ඉතිහාසයේ වාර්තා වූ ඉහළම වරදකරු කිරීම් ගණන වේ.

b. 2018 වසරේ මේ වන විටත් විත්තිකරුවන් 59 දෙනෙක් වරදකරුවන් කර ඇත. එය කොමිෂන් සභාව ලැබූ විශාල ජයග්‍රහණයකි.

c. 2018 ජනවාරි 01 දින සිට සැප්තැම්බර් 30 දින දක්වා කාල පරිච්ඡේදය තුළ අධිකරණයේ පවරන ලද නඩු ගණන 35 කි. ඒ අතර රජයේ ඉහළම තනතුරු හොබවන ලද නිලධාරීන් ද සිටී.
(මේ පිළිබඳ සියලු දත්ත ඇතුළත් වාර්තාවක් අමුණා ඇත.)

d. 2018 සැප්තැම්බර් 30 දින වන විට මහේස්ත්‍රාත් අධිකරණයෙන් 106 ක් ද මහාධිකරණයෙන් 227 ක් ද වශයෙන් විභාග වන මුළු නඩු සංඛ්‍යාව 333 කි. මෙම නඩු කොමිෂන් සභාව මගින් පැමිණිල්ල මෙහෙයවනු ලබන නඩුය.

## 02. නඩු පැවරීම්

අල්ලස් කොමිෂන් සභාවට නැගෙන ප්‍රධාන චෝදනාවක් වන්නේ සාමාන්‍ය ව්‍යවහාරයේ පවතින පරිදි සුළු තානාන්තර දරණ අයට එරෙහිව ඔවුන් පමණක් ඉලක්ක කර ගනිමින් නඩු පවරන බවයි.

**නමුත් පසුගිය දෙවසර පරීක්ෂා කිරීමේ දී හිටපු නීතිපති, හිටපු අභියාචනාධිකරණ විනිශ්චයකාර, හිටපු ඇමතිවරු තිදෙනෙක්, රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවේ සභාපති, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපති, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ අධ්‍යක්ෂ, ලක්සල සභාපති, ලක්සල කළමනාකාර අධ්‍යක්ෂ, ලක්සල අධ්‍යක්ෂ මුදල්, ලක්සල ව්‍යාපෘති අධ්‍යක්ෂ, හිටපු දිසා විනිසුරු, විදුලි අධිකාරී, ඇවන්ගාඩ් සභාපති, යුධ හමුදාවේ හිටපු බ්‍රිගේඩියර්වරයෙක්, රේගු අධිකාරී, සහකාර රේගු අධිකාරී, හිටපු නගරාධිපති, හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වැනි ඉහළ තනතුරු දරණ නිලධාරීන්ට ද නඩු පැවරීම් සිදු කර ඇත.**

ඇවන්ගාඩ් සභාපති සහ හිටපු බ්‍රිගේඩියර්වරයෙකුට විරුද්ධව අල්ලස් ලබා දීම හා අල්ලස් ලබා ගැනීම යන වැරදි දෙකටම එකම නඩුවේ චෝදනා කරමින් සුවිශේෂී නඩුවක් ද පවරා ඇත.

## 03. අල්ලස් වැටලීම්

a. 2017 වසර තුළ සාර්ථක වැටලීම් 57 ක් සිදු කරන ලදී.

b. 2018.10.10 වන විට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් සිදු කළ සාර්ථක වැටලීම් ගණන 30 කි.

c. ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානියා හා දැව සංස්ථාවේ සභාපති අත්අඩංගුවට ගනු ලැබීම මෙසේ සිදු කළ ප්‍රධාන පෙළේ වැටලීමකි. 1958 අල්ලස් දෙපාර්තමේන්තුව පිහිටුවීමෙන් පසුව අත්අඩංගුවට ගනු ලැබූ ඉහළම රාජ්‍ය නිලධාරියා වන්නේ ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානියාය. තවද හිටපු ආනයන අපනයන පාලක, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ සභාපති, ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු, විදුලි අධිකාරී, පොලිස් පරීක්ෂක වැනි තනතුරු දරණ නිලධාරීන් ද අත්අඩංගුවට ගෙන ඇත.

d. ඒ අනුව පොදුවේ ව්‍යවහාර වන පරිදි සාමාන්‍ය නිලධාරීන් නොව ඉහළ තනතුරු දරණ පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම නිසා කොමිෂන් සභාවේ ස්වාධීනත්වය මහජනතාවට මැනවින් තහවුරු වී ඇත. මේ අනුව අනාගතයේ දී අල්ලස් කොමිෂන් සභාවේ ප්‍රධාන තනතුරු කවර හෝ වෘත්තිකයකු විසින් හෙබවූවද ඔවුන්හට කිසිදු බාධකයකින් තොරවම කටයුතු කර ගැනීමට අවශ්‍ය වාතාවරණය සම්පාදනය කරමින් පවතී.

## 04. ශ්‍රේණිගත කිරීම්

a. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ආයතනය විසින් වාර්ෂිකව නිකුත් කරන ලද වාර්තාවට අනුව ශ්‍රී ලංකාව ජාත්‍යන්තර දූෂණ විරෝධී දර්ශකයේ ශ්‍රේණිගත කිරීම් වල අංක 96 සිට අංක 91 දක්වා ඉහළට නංවා තිබේ. එම තත්ත්වය ලබා ගැනීමට කොමිසම සිදු කළ කැපවීම ඉතා විශාලය. කෙසේ නමුත් ලබන වසරේ දී යෝධ පිම්මක් ඉදිරියට පැනීමේ අරමුණින් දැවැන්ත ප්‍රතිසංස්කරණ සමූහයක් මේ වන විට අල්ලස් කොමිෂන් සභාව සිදු කරමින් සිටී.

## 05. ජාතික ක්‍රියාකාරි සැලැස්ම

a. දූෂණ මර්දනය සම්බන්ධයෙන් ජාතික ක්‍රියාකාරී සැලැස්මක් රජය විසින් සකස් නොකිරීම සම්බන්ධයෙන් නොයෙකුත් ජාත්‍යන්තර සංවිධාන විමසා ඇත.

b. UNODC, යුරෝපා සංගමය, විවෘත රාජ්‍ය හවුල්කාරිත්වය මේ සම්බන්ධ අවධානය යොමු කර ඇත.

c. UNCAC ප්‍රතිපාදන යටතේ ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට බැඳී ඇති බව UNODC විසින් ප්‍රකාශ කර ඇත.

d. GSP+ සහනය නියාමනය කිරීමේ දී මෙම කාරණය සම්බන්ධයෙන් යුරෝපා සංගමය විසින් ද අවධානය යොමු කර ඇත.

e. එබැවින්, ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමේ වගකීම අමාත්‍ය මණ්ඩලය විසින් අල්ලස් කොමිෂන් සභාව වෙත පවරා ඇත.

f. මෙම කාර්යය ජනාධිපති ලේකම් කාර්යාලයේ හා අනෙකුත් අමාත්‍යාංශවල සහයෝගයෙන් යුතුව සිදු කළ යුතුව ඇත.

g. මේ සම්බන්ධ පියවර ගණනාවක් දැනටමත් ගෙන ඇත. පහත එම පියවර දැක්වේ.

i. ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන් මූලික සාකච්ඡා පවත්වා ඇත.

ii. සියලු ලේකම්වරු හා ප්‍රධාන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් කැඳවා මේ සම්බන්ධයෙන් දැනුවත් කර ඇත.

iii. මාධ්‍ය සාකච්ඡාවක් පැවති අතර ඔවුන්ගේ සහාය ද අපේක්ෂා කරන ලදී.

iv. 2018 මැයි 15 වන දින අයවැය අධ්‍යක්ෂ විසින් ව්‍යාපෘතිය සඳහා මිලියන 16 ක් වෙන් කළ අතර USAID විසින් ද මෙම කාර්ය සාර්ථක කර ගැනීමට සහාය දක්වනු ඇත.

v. ලෝක බැංකුවේ විශ්‍රාමික නිලධාරියෙකු ද මෙම සැලසුම සකස් කිරීමට සම්බන්ධ වී සිටින දේශීය විශේෂඥයන්ද මීට සම්බන්ධ වී සිටී.

vi. පාර්ලිමේන්තු අධීක්ෂණ කාරක සභාවෙහි දී තොරතුරු විමසීම් වාර හතරක් පැවති අතර මීට අමාත්‍යවරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හා උසස් රාජ්‍ය නිලධාරීන් දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහභාගී වී ජාතික ක්‍රියාකාරී සැලැස්ම වෙනුවෙන් ඔවුන්ගේ යෝජනා ඉදිරිපත් කරන ලදී.

vii. මහජන යෝජනා කැඳවමින් සම්පූර්ණ පුවත්පත් පූර්ණ පිටුවක භාෂා තුනෙන්ම දැන්වීමක් පළ කර අදහස් ලබා ගන්නට යෙදුණි.

viii. තවදුරටත් මහජන අදහස් ලබා ගැනීම සඳහා මුළු දිවයිනම ආවරණය වන පරිදි වැඩසටහන් 30 කට අධික සංඛ්‍යාවක් පවත්වා ඇත. එහිදී රාජ්‍ය අංශය, පුද්ගලික අංශය, සිවිල් සංවිධාන, මාධ්‍ය, කලාකරුවන්, තරුණයන් ඇතුළු අංශ ගණනාවකින් අදහස් හා යෝජනා ලබා ගන්නා ලදී.

ix. දැනට දළ කෙටුම්පතක් වශයෙන් සකස් කර ඇති මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමෙන් අනතුරුව 2018 දෙසැම්බර් මස 09 වන දින එළි දැක්වීමට බලාපොරොත්තුවෙන් සිටී.

## 06. UNCAC බැඳියාවන්

a. ශ්‍රී ලංකාව, එක්සත් ජාතීන්ගේ දූෂණයට එරෙහි සම්මුතියට 2004 මාර්තු මස 15 වෙනි දින අත්සන් තබා 2004 මාර්තු 31 වෙනි දින පිළිගෙන ඇත. ඒ අනුව ශ්‍රී ලංකා රජය දූෂණයට එරෙහිව සටන් කිරීම සඳහා ප්‍රමාණවත් නෛතික පසුබිමක් හා පරිපාලන නිර්ණායකයන් ඇති කිරීමට එක්සත් ජාතීන්ගේ දූෂණයට එරෙහි ප්‍රඥප්තියේ 05(02) ව්‍යවස්ථාව යටතේ බැඳී සිටී. ඒ අනුව දූෂණයට එරෙහිව ප්‍රමාණවත් නෛතික පද්ධතියක් සහ යාන්ත්‍රණයක් ඇති කර ඇත්දැයි ජාත්‍යන්තරය විසින් කලින් කලට ඇගයීමට ලක් කරයි. ඒ අතරම එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී ප්‍රඥප්තියේ ශ්‍රී ලංකාව ඇතුළත ක්‍රියාත්මකවීමට අදාළ කේන්ද්‍රීය ආයතනය (Focal Point ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වේ.

b. මෙම දූෂණ විරෝධී සම්මුතිය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් කලින් කලට විවිධ ජාත්‍යන්තර ආයතන වලට පිළිතුරු සැපයීමට සිදුව ඇත.

c. ඒ අනුව UNCAC රාජ්‍ය පාලන සාමාජිකත්වය යටතේ පළමුවන සමාලෝචන ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට ශ්‍රී ලංකාව සමත් වී ඇත. එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී ප්‍රඥප්තියෙහි 3 වන (අපරාධකරණය) හා 4 වන (ජාත්‍යන්තර සහයෝගීතාව) පරිච්ඡේදයන් මෙයට අදාළ වේ.

d. තවද ඉහත සම්මුතියේ දෙවන සමාලෝචන ක්‍රියාවලියේ 2 වන (නිවාරණය) හා 5 වන (වත්කම් ආපසු අත්පත් කර ගැනීම) පරිච්ඡේදයන් සම්පූර්ණ කිරීමට ද ශ්‍රී ලංකාවට හැකි වී ඇත. එයට අදාළ ස්වයං අධ්‍යයන වාර්තා සකස් කර එක්සත් ජාතීන්ගේ අපරාධ හා මත්ද්‍රව්‍ය පිළිබඳ කාර්යාලයට යොමු කරන ලද්දේ කොමිෂන් සභාවේ සම්පූර්ණ කැපවීමෙනි.

e. 2018 ජුනි මස පළමු සතියේ පැවැති ජාත්‍යන්තර සමාලෝචන කණ්ඩායම (IRG) සැසිවාරයේදී UNODC විසින් අප රටට අදාළ වාර්තාව ජාත්‍යන්තර ප්‍රජාව වෙත ඉදිරිපත් කරන ලදී.

f. වර්තමානයේ එම වාර්තාවන් UNODC හි වෙබ් පිටුවෙහි අන්තර්ගත කර ඇත.

g. ශ්‍රී ලංකාව ද ඉහත සම්මුතියේ අනෙකුත් රටවල් නිරීක්ෂණය කරන රටක් ලෙස සමාලෝචන ක්‍රියාවලියට එක් වූ අතර එහි දී බොට්ස්වානා රටේ දෙවන සමාලෝචන සැසියට ශ්‍රී ලංකාව සහ ගිනි යන රට එකතුව සිදු කරන ලද අතර ශ්‍රී ලංකාව වෙනුවෙන් නීති අංශයෙන් නිලධාරිනියක් සමාලෝචන විශේෂඥයෙක් ලෙස සහභාගි වන ලදී.

## 07. UNODC පිළිගැනුම

a. මෙම කලාපය තුළ සීඝ්‍රයෙන් දියුණු වෙමින් පවතින දූෂණයට එරෙහිව කටයුතු කරන ආයතනයක් ලෙස අල්ලස් කොමිසම UNODC විසින් පිළිගෙන ඇත.
b. එබැවින් විශේෂඥ ගෝලීය සමුළුවක් 2018 ජූලි 25 සිට 27 දක්වා දිනයන්හි දී ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් කොළඹ දී පවත්වන්නට යෙදුණි.
c. ඒ සඳහා ලොව නන් දෙසින් අල්ලස හා දූෂණ නිවාරණය පිළිබඳ විශේෂඥවරුන්ගේ පැමිණීම සිදු වූ අතර මෙම සමුළුව ලංකාවේ පැවැත්වීමට හැකිවීම අල්ලස් කොමිසම හා ශ්‍රී ලංකාව ලැබූ විශාල ජයග්‍රහණයකි.
d. මෙම අවස්ථාව සඳහා සම සත්කාරත්වය අල්ලස් කොමිසම දරනු ලැබීය.

## 08.විවෘත රාජ්‍ය පාලන හවුල්කාරිත්වය (OPEN GOVERNMENT PARTNERSHIP)

a. විවෘත රාජ්‍ය පාලන හවුල්කාරිත්වය (Open Government Partnership) යටතේ වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීමට ද අල්ලස් කොමිෂන් සභාව සක්‍රීය දායකත්වයක් ලබා දෙන ලදී.

## 09.GSP + සහනය

a. ලංකාවට ආර්ථිකමය වශයෙන් ඉතාමත් වටිනාකමක් ඇති GSP + සහනය ලංකාව තුළ රඳවාගැනීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ඉතා විශාල වගකීමක් ඉටු කිරීමට අල්ලස් කොමිසමට හැකියාව ලැබුණි.

b. මන්දයත් එම සහනය ලංකාවට ලබා දීමේ දී සලකා බලනු ලබන ප්‍රධාන සාධකයක් වන්නේ අල්ලස හා දූෂණයට එරෙහිව ගෙන ඇති පියවරයි.

c. ඒ අනුව පසුගිය ජුනි මාසයේ බෙල්ජියමේ බ්‍රසල්ස් නුවර පැවති යුරෝපා සංගමයේ රැස්වීමට අල්ලස් කොමිසමේ අධ්‍යක්ෂවරයා සහභාගී වී අප විසින් සිදු කරන ලද ක්‍රියාවන් ඉදිරිපත් කරන්නට යෙදුණු අතර යුරෝපා සංගමය එම කර්තව්‍යන් ප්‍රශංසනාත්මකව සලකා බලන ලදී.

## 10.ව්‍යවහාරික විමර්ශකයින් බඳවා ගැනීම

a. අල්ලස් කොමිසමේ ඉතිහාසය පුරාම එකදු විශේෂඥ නිලධාරියෙක්වත් නොසිටින ලදී. එහෙත් ගණකාධිකරණය, විගණනය, මූල්‍ය විශ්ලේෂණය, ඩිජිටල් විමර්ශන, බැංකුකරණය, ආරක්ෂණ, බැංකුකරණය, ජාත්‍යන්තර සම්මුතීන්, ප්‍රසම්පාදනය, ඉදිකිරීම්, ඉංජිනේරු විද්‍යාව, කළමනාකරණය, හා රාජ්‍ය පරිපාලනය යන ක්ෂේත්‍ර වලට අයත් විශේෂඥයින් 200 ක් බඳවා ගැනීමට රාජ්‍ය යාන්ත්‍රණය හරහා අනුමැතිය ලබා ගන්නා ලදී.

b. එයට අදාළ ගැසට් නිවේදනය 2018 ජුනි මස පළමු සතිය තුළ නිකුත් කරන ලදී. 2018 අගෝස්තු 01 දින අයදුම්පත් භාර ගැනීම අවසන් විය. ඒ සඳහා අයදුම්පත් 8000 කට වැඩි ප්‍රමාණයක් ලැබී ඇත. විභාග කොමසාරිස්වරයා විසින් ලිඛිත පරීක්ෂණයකින් පසුව ඔවුන් බඳවා ගැනීමට කටයුතු කරමින් සිටී.

## 11. නිවාරණ නිලධාරීන් බඳවා ගැනීම

a. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 156 වන ව්‍යවස්ථාව තුලින් නිවාරණ ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතු බව දක්වා සිටියද මේ වන තුරුම අප රට විසින් නිවාරණ ඒකකයක් පිහිටුවා නැත. එබැවින් නිවාරණ නිලධාරීන් 50 ක් බඳවාගෙන නිවාරණ ඒකකයක් පිහිටුවීමට රාජ්‍ය යාන්ත්‍රණය හරහා අනුමැතිය ලබා ගන්නා ලදී.

b. එමෙන්ම අල්ලස් කොමිසමේ විෂය පථය තුල නොවුණු නිවාරණ නිලධාරි තනතුර ඇති කිරීමට අවශ්‍ය මූලික පියවර ගෙන නිවාරණ නිලධාරින් 50 දෙනෙකු බඳවා ගැනීමට අයදුම්පත් කැඳවන ලදී. ඒ සඳහා අයදුම්පත් 5000 කට අධික ප්‍රමාණයක් ලැබී ඇති අතර සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමෙන් පසු බඳවා ගැනීමේ කටයුතු සිදු කෙරේ.

c. අල්ලස් කොමිෂන් සභාව කෙරෙහි වර්තමානයේ ඇති ආකර්ෂණය පිළිබිඹු කරන එක් සාධකයක් වන්නේ මෙලෙස අලුතින් ඇති කරන ලද තනතුරු සඳහා දස දහස් ගණනින් තරුණ තරුණියින් තම කැපකිරීම් කිරීමට සූදානම්ව අයදුම්පත් ඉදිරිපත් කර තිබීමයි.

## 12. නීති සංශෝධනය

a. අල්ලස, දූෂණය හා වත්කම් සම්බන්ධ නීති සංශෝධනයක් 1994 වර්ෂයේ සිටම සිදු වී නොමැත. ඒ පිළිබඳව සිදු කරන ලද අධ්‍යයනයකින් පසුව අදාළ නීති සංශෝධනය කිරීම සඳහා ගරු ජනාධිපතිතුමා මගින් අමාත්‍ය මණ්ඩලය වෙත යෝජනා ඉදිරිපත් කරන ලදී. අමාත්‍ය මණ්ඩලය විසින් ඒ සඳහා අනුමැතිය ලබා දෙන අතර අදාළ නීති සංශෝධනය සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස නීති කෙටුම්පත් සම්පාදකතුමිය දන්වා ඇත.

b. එහි දී අත්‍යවශ්‍ය සංශෝධනයක් 2018 අංක 22 දරණ සංශෝධනයෙන් අල්ලස් පනතට සිදු කරන ලද අතර එමගින් මෙතෙක් මහෙස්ත්‍රාත් අධිකරණයේ පමණක් ගොනු කිරීමට හැකි වූ දූෂණය වරද යටතේ වන නඩු මහාධිකරණයේ ගොනු කිරීමට හැකියාව ලැබිණි.

c. එහිදී අල්ලස් පනත, වත්කම් බැරකම් නීතිය, අල්ලස් හෝ දූෂණ චෝදනා කොමිෂන් සභා පනත ආදී පනත් සංශෝධනය කිරීමට පියවර ගනිමින් සිටී.

d. අනෙක් අතට අනෙකුත් ආයතන සමඟ එකතුව අධිකරණ සංවිධාන පනතට සංශෝධන ගෙන ඒමටද අල්ලස් කොමිසමට හැකිවීම ඉදිරි පියවරක් වේ. ඒ යටතේ ත්‍රිපුද්ගල විනිසුරු සභාවක් හමුවේ ආර්ථිකමය අපරාධ වැරදි විභාග කිරීමට හැකිවීම රටක් වශයෙන් අප ලැබූ ජයග්‍රහණයකි.

e. තවදුරටත් සංශෝධනය කරන නීති පහත පරිදි වේ.

### I. අල්ලස් පනත

පහත සඳහන් ගැටලු පිළිබඳව සලකා බලනු ඇත.

- පෞද්ගලික අංශයේ අල්ලස් ගැනීම්
- ත්‍යාග රෙගුලාසි
- බැඳියාවන් අතර ගැටුම්
- මුදල් විශුද්ධිකරණ හා සාක්ෂිකරුවන් හා වින්දිතයන් සම්බන්ධ වැරදි විමර්ශනය කරන ආකාරය
- විදේශීය රාජ්‍ය නිලධාරීන් සම්බන්ධයෙන් වන අල්ලස්

## II. පරීක්ෂණ කොමිෂන් සභා පනත

- ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් රැස් කරන ලද සාක්ෂි සලකා බැලීමට අල්ලස් කොමිසමට බලයක් නොමැත.(විමර්ශන කොමිසම). එම නිසා සාක්ෂිකරුවන් නැවත කැඳවා ප්‍රකාශ සටහන් කිරීමට අල්ලස් කොමිසමට සිදුවේ.
- අල්ලස් කොමිසම සතුව මෙවැනි විමර්ශන කොමිෂන් වාර්තා 30 ක් පමණ තිබෙන අතර මෙහි සඳහන් සියලුම සාක්ෂි නැවත කැඳවන්නට සිදුවීම නිසා විශාල කාලයක් වැයවේ. එබැවින් ඉහත සඳහන් කළ පරිදි සංශෝධනයක් කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගෙන ඇත.
- වර්තමානයේ එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. මෙය පාර්ලිමේන්තුවේ නීති කටයුතු පිළිබඳ ආංශික කමිටුව මගින් 2018.07.19 දින අනුමත කර ඇත. ඒ අනුව දෙවන වර කියවීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට සූදානමින් ඇත.

## III. වත්කම් ප්‍රකාශ කිරීමේ නීතිය

- අපගේ වත්කම් ප්‍රකාශ කිරීමේ නීතියෙහි ඇති අඩුපාඩු සෙවීම සඳහා ශ්‍රී ලංකාවේ විශේෂඥයින් සමඟ සාකච්ඡා කිරීමට ලෝක බැංකුවේ, UNODC, ස්ලෝවේනියාව හා ඉන්දුනීසියාව වැනි රටවල විශේෂඥයින් මාර්තු මාසයේ දී කොළඹට පැමිණෙන ලදී. ඔවුන්ගේ යෝජනා සකසන ලදී.

- අදාළ යෝජනා පිළිබඳ සලකා බලා අවසන් තීරණයක් ගැනීමට ලෝක බැංකු කණ්ඩායම 2018 ජුනි 17 දින සිට ජුනි 19 දක්වා නැවත ශ්‍රී ලංකාවට පැමිණ දීර්ඝ වශයෙන් සාකච්ඡා කොට ලෝකයේ වත්කම් නීතිය සමඟ යාවත්කාලීන කිරීම සඳහා යෝජනා සමූහයක් ඉදිරිපත් කරන ලදී. ඒ සඳහා අප රටේ විශේෂඥවරුන්ගේ හා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතුව ප්‍රතිපත්තිමය රාමුවක් ද සකස් කර ඇත.

- ඊට අමතරව විදුලි සංදේශ ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම්තුමා සමඟ මින් ඉදිරියට වත්කම් බැරකම් මාර්ගගත (online) ක්‍රමය යටතේ ලබා දීමට අදාළ පහසුකම් පිළිබඳ සාකච්ඡා කොට ඇත. එසේම වත්කම් පෝරමය විශාල වෙනස්කම් සහිතව යාවත්කාලීන කිරිමට යෝජනා කර ඇත.

යෝජිත සංශෝධන වලින් සමහරක් මෙසේය.

- ✓ වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දිය යුතු පුද්ගලයන්ගේ පරාසය පුළුල් කිරිම.

- ✓ වත්කම් බැරකම් ප්‍රකාශ යන විෂය ක්ෂේත්‍රයට අදාළ කොටස නූතනයේ දක්නට ලැබෙන වත්කම් හා බැරකම් වර්ග දැනට පවතින වත්කම් බැරකම් ප්‍රකාශයේ ඇතුළත් වී නොමැති නිසා ඒවා ඇතුළත් කිරීම.
- ✓ දැනට අවුරුද්දකට වතාවක් දෙනු ලබන වත්කම් බැරකම් ප්‍රකාශය වෙනුවට විශ්‍රාම යන අවස්ථාවේ දී හා විශ්‍රාම ගොස් අවුරුදු 02 ක් යන තෙක් වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දීමට නියම කිරීම. තවද යම් අවුරුද්දක් ඇතුළත විශාල වශයෙන් යම් දිනක දී වත්කම් වැඩි වුවහොත් ඒ බව දින 15 ක් තුළ අනාවරණය කළ යුතු වීම.
- ✓ වත්කම් බැරකම් ප්‍රකාශය භාර ගැනීම, විශ්ලේෂණය, පසු විපරම සඳහා විශේෂිත ආයතනයක් පිහිටුවීම. වර්තමාන නීතියේ පවතින වත්කම් බැරකම් ප්‍රකාශ සම්බන්ධ වරදවල් සඳහා දඬුවම් ප්‍රමාණවත් පරිදි ඉහළ නැංවීම.

- ඉන්පසුව ඒ පිළිබඳව සලකා බලා අවශ්‍ය යෝජනා සිදු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරෙනු ඇත.

### IV. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත

- අනෙකුත් ආයතන සමඟ එක්ව හවුල් විමර්ශන පැවැත්වීම
- නීතිපතිගෙන් නීති උපදෙස් විමසීමේ අවසරය
- තොරතුරු සපයන්නන් පිළිබඳ විධිවිධාන
- නිවාරණය පිළිබඳ බලතල

## 13. නිවාරණය

a. අල්ලස් හා දූෂණ නිවාරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ කිසිදු අවස්ථාවක විධිමත් යාන්ත්‍රණයක් තිබී නැත. හොංකොං, මැලේසියා, භූතානය හා කොරියාව වැනි රටවල නිවාරණය සම්බන්ධ ප්‍රමුඛතාව ලබා දී ඇත. ඔවුන් විමර්ශන හා නඩු පැවරීම් සම්බන්ධයෙන් පමණක් විශ්වාස නොකරයි. "විමර්ශනය හා නඩු පැවරීමට වඩා දහස් වාරයක් නිවාරණය වටින්නේය" යනු ඔවුන් ගේ තේමා පාඨයයි.

b. කෙසේවෙතත්, නිවාරණයෙහි ඇති වැදගත්කම සම්බන්ධයෙන් මෙම රට තුළ ඇති දැනීමක් නැත. එබැවින් නිවාරණ වැඩසටහන් ශක්තිමත් කර රාජ්‍ය අංශය තුළ සුපිළිපන්න උපායන් ශක්තිමත් කිරීමට අදහස් කර ගෙන ඇත. මෙම කාරණය පෙරදැරි කර ගනිමින් පසුගිය මාස කිහිපය තුළ පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.

i. මැලේසියාවේ සුපිළිපන් ආයතනයේ සභාපති ශ්‍රී ලංකාවට පැමිණි අතර ලංකාවේ උසස් නිලධාරීන් හා අල්ලස් කොමිෂන් සභාවේ නිලධාරීන් සමඟ සාකච්ඡා වට තුනක් පවත්වන ලදී.

ii. ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන් හා නීතිපති, අල්ලස් කොමිෂන් සභාවේ කොමසාරිස්වරයෙකු, අල්ලස් කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් හා අතිරේක සොලිසිටර් ජනරාල් යන නිලධාරීන්ගෙන් සැදුම්ලත් නියෝජිත පිරිසක් භූතානයේ සංචාරය කළ අතර එහි අගමැතිවරයා, අගවිනිසුරු, කථානායක, නීතිපති හා දූෂණ විරෝධී සමාජවල සාමාජිකයන් හමුවී රාජ්‍ය අංශය තුළ සුපිළිපන්නභාවය ඇති කිරීමට අනුගමනය කරන ක්‍රියාවන් සම්බන්ධ අධ්‍යයනයක් කරන ලදී.

iii. අල්ලස් කොමිෂන් සභාවේ නියෝජිතයන් හා නීති කෙටුම්පත් සම්පාදක හොංකොං හි සංචාරය කළ අතර එහි දී දූෂණ විරෝධී ආයතන හා ඒවා අනුගමනය කරන ක්‍රියාමාර්ග සම්බන්ධ හා ක්‍රියාකාරි සැලැස්ම සම්බන්ධ අවධානය යොමු කර ඇත.

iv. මුරුසි දිවයිනේ විශේෂඥ නියෝජිත පිරිසක් ශ්‍රී ලංකාවට පැමිණි අතර ඔවුන්ගේ නිවාරණ වැඩපිළිවෙල සම්බන්ධයෙන් දැනුවත් කරන ලදී.

## 14. සුපිළිපන්න සැලැස්ම

ශ්‍රී ලංකාව සඳහා ජාතික සුපිළිපන්න ඒකාබද්ධතා රාමුවක් (National Integrity Plan) සකස් කිරීමට අදාළ සංකල්ප පත්‍රිකාවක් හා අප රට තුළ ක්‍රියාත්මක කළ යුතු නිවාරණ වැඩපිළිවෙල (Corruption Prevention Plan) සඳහා වූ සංකල්ප පත්‍රිකාවක් සකස් කර එය කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත.

## 15. අධ්‍යාපනය

a. දූෂණයට විරුද්ධව කටයුතු කිරීමට නම් සමාජයේ ආකල්ප වෙනස් කළ යුතු බවට ලෝකයේ මතයක් ඇති වෙමින් පවතී. මෙම කාර්යයට ළමුන් හා වැඩිහිටියන් ඇතුලත් වේ.

b. මෙම සංකල්පය වර්ධනය කිරීම සඳහා පහත කරුණු අනුගමනය කර ඇත.

i. පාසල් තුළට දූෂණ විරෝධී ආකල්ප ඇතුලත් කිරීම සඳහා අධ්‍යාපන බලධාරින් සමග සාකච්ඡා ගණනාවක් පවත්වා ඇත.
ii. ළමුන් සඳහාම සැකසුණු දැනුවත් කිරීමේ වැඩසටහන් පැවත්වීම.
iii. රට පුරා වැඩිහිටියන් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් 100 කට වඩා පවත්වා ඇත. රාජ්‍ය සේවකයන්, පොලිස් නිලධාරීන්, සිවිල් සමාජ සාමාජිකයන් මීට ඇතුළත්ය.
iv. ජනතාව දැනුවත් කිරීමට මේ දක්වා විශාල මාධ්‍ය ප්‍රචාරණයක් ලබාගෙන නැත. කඩිනමින් එවැනි ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමට පියවර ගනිමින් සිටී. එහි දී දැනට ජනතාව දැනුවත් කිරීම සහ ආකල්ප වර්ධනය කිරීම සඳහා කෙටි වීඩියෝ පටයක් නිර්මාණය කර ඇත.

c. රාජ්‍ය නිලධාරින්ගේ හඳුන්වාදීමේ වැඩසටහන් සඳහා දූෂණ මර්දනය සම්බන්ධයෙන් වැඩසටහන් හා ඉදිරිපත් කිරීම් ඇතුලත් කිරීමට සැලසුම් සකසා ඇත.

## 16. පුහුණු කිරීම

විමර්ශන හා නඩු මෙහෙයවීම ශක්තිමත් කිරීමට දේශීය හා විදේශීය වැඩසටහන් සංවිධානය කර ඇත. ඒවා පහත පරිදි වේ.

a. දූෂණ මර්දනය සම්බන්ධ මැලේසියානු අධ්‍යයන ආයතනය වෙත විමර්ශන නිලධාරින් හා නඩු මෙහෙයවීමේ නිලධාරින් 45 ක් පුහුණුව සඳහා යවන ලදී

b. පුහුණුව සඳහා සිංගප්පූරුව, කොරියාව, චීනය වෙත නිලධාරීන් යවන ලදී.

c. හොංකොං දූෂණ මර්දන කොමිෂන් සභාව වෙත උසස් රාජ්‍ය නිලධාරින්, විමර්ශකයන් නඩු මෙහෙයවන්නන් යැවීමට යෝජනා වී ඇත. අපගේ යෝජනාවට කොමිෂන් සභාව එකඟ වී ඇත.

d. UNODC, අධිකරණ දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව ලබා දුන් අනුග්‍රහය සහ සහයෝගය යටතේ දේශීය වැඩසටහන් කිහිපයක් පවත්වා ඇත.

e. රාජකාරි ඉටු කිරීමේ දී ඇතිවන තත්ත්වයන්ට මුහුණ දිය හැකි වන පරිදි කරුණු ඇතුළත් විමර්ශන අත්පොතක් හා නඩු මෙහෙයවීමේ මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීමට පියවර ගෙන ඇත.

## 17. වෙබ් අඩවිය දියත් කිරීම

a. දිගු කාලයක සිට අවශ්‍යතාවක්ව තිබූ වෙබ් අඩවිය 2017 දෙසැම්බර් මස දියත් කරන ලදී. වර්තමාන තත්ත්වයන්, නඩු පැවරීම්, අවසන් වූ නඩු සම්බන්ධයෙන් පොදු ජනතාව දැනුවත් කිරීමට මේ මගින් හැකි වී ඇත.

b. කෙසේ වෙතත් පවත්නා විමර්ශන සම්බන්ධයෙන් පූර්ණ රහස්‍යභාවය ආරක්ෂා කරනු ලැබේ.

c. ලංකාවේ පවතින දහස් ගණනක් වෙඩ් අඩවි අතරින් ලංකා lk.domain ආයතනය මගින් සංවිධානය කරන ලද තරගයෙන් කුසලතා සම්මානයක් ලබා ගැනීමට මාස 06 ක් වැනි කෙටි කාලයක් මෙම කොමිෂන් සභාවේ වෙබ් අඩවිය සමත් විය. ජනතා ආකර්ෂණය ලබා ගනිමින් ජනතාවට වඩාත් සමීපවීමට අප වෙබ් අඩවිය සමත් වී ඇත. ශ්‍රව්‍ය දෘශ්‍ය ඌනතා සහිත පුද්ගලයන් සඳහා ද ප්‍රවේශ විය හැකි ආකාරයට වෙබ් අඩවිය සකසා ඇති අතර කොමිෂන් සභාවට යොමු කරනු ලබන වරදවල් සම්බන්ධ පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා ක්‍රම 08 ක් හඳුන්වා දෙමින් ජනතාව වෙත වඩාත් සමීප සේවාවක් ලබා දීමට කටයුතු කර ඇත.

# C. අභියෝග

ශ්‍රී ලංකාව තුළ දූෂණ මර්දන වැඩසටහන් ශක්තිමත් කිරීමට අල්ලස් කොමිෂන් සභාව විසින් අභියෝග ගණනාවකට මුහුණ දීමට සිදුව ඇත. ඒවා පහත පරිදි වේ.

## 01. කාර්යාල ඉඩ හා අනෙකුත් පහසුකම් ප්‍රමාණවත් පරිදි නොවීම

a. අල්ලස් කොමිෂන් සභාවට ඇති විශාලතම අභියෝගය වන්නේ එහි කාර්යයන් ඉටු කිරීමට ප්‍රමාණවත් කාර්යාල පහසුකම් හා වෘත්තිමය පහසු පසුබිමක් නොවීමයි.

b. අල්ලස් කොමිෂන් සභාවට වර්තමානයේ විමර්ශකයන් 200ක හිඟයක් පවතී. ඉතා කඩිනමින් විමර්ශන අංශයක් හා නිවාරණ අංශයක් ස්ථාපිත කරනු ඇත. ඩිජිටල් වෝහාරික ඒකකය, බුද්ධි ඒකකයක්, වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ ඒකකය, අධ්‍යාපන ඒකකය ඇතිකිරීමට සැලසුම් සකසා ඇත. මේ සියල්ල ඉටු කිරීම සඳහා අල්ලස් කොමිෂන් සභාවට නිසි ඉඩ පහසුකම් අවශ්‍ය වී ඇත.

c. පවතින ගොඩනැගිලි ඉරිතැලීමට ලක්ව ඇති බැවින් මෙම තත්ත්වය බැරෑරුම් වී ඇත. රජයේ ඉංජිනේරුවරු විසින් සිදු කළ අනතුරු ඇඟවීම නිසා නිලධාරීන් 75 ක් පමණ එම ගොඩනැගිලි වලින් ඉවත් කර කැප්පෙටිපොළ මාවතේ ඇති පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ ගොඩනැගිල්ල වෙත යවා ඇත.

d. නව රජය 2015 වසරේ බලයට පැමිණීමෙන් පසුව ගරු අගමැතිතුමා අල්ලස් කොමිෂන් සභාවට පැමිණි අතර මෙම භූමියට යාබදව ඇති බන්ධනාගාර කොමසාරිස්ගේ නිල නිවාස භූමිය අල්ලස් කොමිෂන් සභාව සඳහා නව ගොඩනැගිල්ලක් ඉදි කිරීමට නිසි භූමියක් බව හඳුනා ගන්නා ලදී. අමාත්‍ය මණ්ඩල ආර්ථික කමිටුව විසින් ගනු ලැබූ තීරණයකට අනුව එම භූමිය අල්ලස් කොමිෂන් සභාව වෙත පවරන ලදී. ඒ අනුව භාණ්ඩාගාරයෙන් මුදල් වෙන්කර ගැනීමට CCB විසින් සකස්කර UDA අනුමැතියට යටත් සැලසුමක් ඉදිරිපත් කරන ලෙස ජනාධිපති ලේකම් විසින් අල්ලස් කොමිෂන් සභාව වෙත උපදෙස් ලබා දෙන ලදී.

e. UDA විසින් අවස්ථා කිහිපයක දී බාධාවන් මතු කර අවසානයේ දී මහල් 08 ක ගොඩනැගිල්ලක් ඉදි කිරීමට අනුමැතිය ලබා දී ඇත. එය ප්‍රමාණවත් නොවුණ ද යම් ආකාරයක ජයග්‍රහණයකි. දැන් කොමිෂන් සභාව වෙත ඇති අභියෝගය වන්නේ ඒ සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන වෙන් කර ගෙන කඩිනමින් ගොඩනැගිල්ල ඉදි කර ගැනීමයි.

## 02. නීති නිලධාරීන්ගේ හා විමර්ශන නිලධාරීන්ගේ අඩු වැටුප්

a. නඩු මෙහෙයවන නිලධාරින්ගේ වැටුප් අඩු මට්ටමක පැවතීම හේතුවෙන් නීති නිලධාරින් රඳවා ගැනීම අපහසු වී ඇත.

b. නීති නිලධාරීන් බඳවා ගැනීමට හා බඳවා ගත් නිලධාරින් තනතුරේ රඳවා ගැනීමට අල්ලස් කොමිසමට ඉතිහාසය තුළ මහත් වෙහෙසක් දැරීමට සිදුව ඇත. ඊට හේතුව වී ඇත්තේ අඩු වැටුප් හා අනාගත බලාපොරොත්තුන්ය. ඉන්දුනීසියාව වැනි රටවල දූෂණ විරෝධී කොමිෂන් සභාවන්හි නඩු මෙහෙයවන නිලධාරීන්ගේ වැටුප් අධිකරණ දෙපාර්තමේන්තුවේ නඩු මෙහෙයවන නිලධාරීන්ගේ වැටුපට වඩා වැඩිය. එබැවින්;

c. මෑතකදී දෙපාර්තමේන්තු නිලධාරින්ගේ වැටුප් වැඩි කරන ලදී. මේ නිසා රජයේ නීතිඥවරු වීමේ උනන්දුව වැඩි වී ඇත. එබැවින් ජනාධිපති ලේකම් කාර්යාලය හරහා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙත අල්ලස් කොමිෂන් සභාව විසින් යෝජනාවක් ඉදිරිපත් කර ඇත.

d. අල්ලස් කොමිෂන් සභාවේ නිලධාරින් වෙත 25% ක දීමනාවක් ලබාදෙන අතර එය 2015 වසරේ වැටුප මත ගණනය කරනු ලැබේ. රජයේ දෙපාර්තමේන්තු කිහිපයක් මුදල් උපයන ආයතන ලෙස නම් කර ඇත. එම ආයතනවල නිලධාරීන්ට අතිරේක දීමනා ලබා දේ. අල්ලස් කොමිෂන් සභාව එපරිද්දෙන් 75% ක දීමනාවකට ඇතුලත් නොකිරීම කණගාටුවට කරුණකි. මෙය ඔවුන් වෙත පෙර ලබා දුන් දීමනාවකි.

e. මීට පෙර නීතිපති දෙපාර්තමේන්තුවේ හා අල්ලස් කොමිෂන් සභාවේ නිලධාරීන්ගේ වැටුප් සම්බන්ධයෙන් විමසා බැලීමට අමාත්‍ය මණ්ඩල අනු කමිටුවක් (ගරු තිලක් මාරපන මහතාගේ ප්‍රධානත්වයෙන්) පත් කරන ලද අතර අල්ලස් කොමිෂන් සභාවේ නිලධාරීන් වෙත වැටුප් වැඩි කිරීමක් නිර්දේශ කරන ලදී.

f. කෙසේ වෙතත් වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව තවමත් ඊට අනුමැතිය ලබා දී නැත.

## 03. කාර්ය මණ්ඩල හිඟය

a. හොංකොං හි මිලියන 6 ක ජනගහනයක් සිටියද විමර්ශකයන් 1000 ට වඩා දූෂණ මර්දන කොමිෂන් සභාවේ ඇත. මැලේසියාවේ ද ප්‍රමාණය මෙපරිදිම වේ.

b. ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන 21 ක් වුවද විමර්ශකයක් 200 ක් හා නීති නිලධාරින් 28 ක් පමණක් සිටී. මෙය අතිශයින්ම ප්‍රමාණවත් නොවේ.

## 04. ප්‍රමාණවත් පරිදි නිලධාරීන් පුහුණු කිරීමට ප්‍රතිපාදන නොමැති වීම.

a. විශේෂයෙන් වඩාත් කාර්යක්ෂම විමර්ශන හා නඩු පැවරීමේ ක්‍රමවේදයක් අනුගමනය සඳහා ප්‍රමාණවත් හා පුහුණු විමර්ශකයන් හා නඩු මෙහෙයවන නිලධාරීන් සිටිය යුතු වේ. මන්දයත් අද අපරාධකරන්නන් සියලු දෙනාට ඉදිරියෙන් සිටී. විශේෂයෙන් අල්ලස හා මහා පරිමාණ දූෂණ වැනි වැරදි කරන්නන් ඒවා සිදු කරන්නේ විශේෂඥ උපදෙස් ද ලබා ගනිමිනි. ඒවා විමර්ශනය කිරීමේදී ද ඔවුන් වරදින් සැඟවී ගැලවී සිටීමට විශාල උත්සහායක් දරයි. එවැනි විටක මෙවැනි අපරාධ වැරදි විමර්ශකයන් හා නඩු මෙහෙයවන නිලධාරීන් ඉතා දක්ෂ හා පුහුණු හැකියාවෙන් යුතු අය විය යුතුය. අල්ලස් කොමිසමේ නිලධාරීන් නිරන්තරයෙන් දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ඇති සාධනීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගි කරවිය යුතු වේ. නමුත් මූල්‍යමය ශක්තිය ප්‍රමාණවත් නොවීම මත නිලධාරීන් පුහුණු කිරීම අඛණ්ඩව සිදු කිරීමේ හැකියාවක් නොමැති වී ඇත.

b. අනෙක් අතට විමර්ශන හා නඩු මෙහෙයවීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම කරන අතරම වඩා ඵලදායි වූ අල්ලස් හා දූෂණ නිවාරණ ක්‍රමවේදයක් හා වැඩපිළිවෙලක් අනුගමනය කළ යුතු වේ. අප රට තුළ සාර්ථක නිවාරණ ක්‍රමවේදයක් සියලු අංශයන් ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීම කළ යුතුය. ඒ සඳහා දැනුමෙන් හා හැකියාවෙන් යුතු ප්‍රමාණවත් පුහුණු නිලධාරීන් සිටිය යුතුය. ඒ අනුව නිවාරණ නිලධාරීන් වශයෙන් බඳවා ගන්නා පිරිස හා රාජ්‍ය අංශයේ ආයතන මට්ටමින් තෝරාගත් ඉහළ නිලධාරීන් පුහුණු කිරීම සිදු කළ යුතුය.

## 05. ජනතාව දැනුවත් කිරීම හා අල්ලස් හා දූෂණ නිවාරණ ක්‍රියාවලිය සඳහා ජනතාව එක්රැස් කර ගැනීමට විද්‍යුත් හා ඩිජිටල් ක්‍රම භාවිතා කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැතිවීම.

a. ආකල්පමය වෙනසක් තුළින් උසස් හරයන් ජනතා සිත්සතන් තුලට කාවැද්දීම තුළින් ඔවුන් තුළ මුල් බැස ගත් අල්ලස හා දූෂණයේ අංකුර ඉවත් කිරීම රජයක් විසින් කළ යුතු ප්‍රධාන මෙහෙවරකි. වෙනත් රටවලින් අප ලබා ගත් අත්දැකීම් අනුව යහපත් හරයන් ජාන තුළට කිඳා බැස්සවීම සඳහා බහුවිධ ක්‍රමවේදයන් අනුගමනය කළ යුතුව ඇත.

b. ඒ යටතේ ප්‍රධාන වශයෙන් ගුවන් විදුලිය, රූපවාහිනය හා මුද්‍රිත මාධ්‍ය යොදා ගනිමින් දැන්වීම්, සාකච්ඡා, වෙළෙඳ දැන්වීම්, වාර්තා වැඩසටහන් හා ටෙලි නාට්‍ය ප්‍රචාරය කිරීම අත්‍යවශ්‍ය වේ. ඊට අමතරව වීඩියෝ පට, ශ්‍රව්‍ය දෘශ්‍ය පට, කෙටි චිත්‍රපට, වීදි නාට්‍ය හා දැන්වීම් පුවරු භාවිතය තුළින් ජනතාවට නිරන්තර අල්ලස හා දූෂණය පිටු දැකීමේ පණිවිඩය ඇස ගැටෙන සේ තැබීම තුළින් යහපත් හරයන් ජනතාවගේ කාවැද්දීම මූලික අරමුණයි.

c. විවෘත රාජ්‍ය පාලන හවුල්කාරිත්ව සමුළුව අමතමින් ගරු ජනාධිපතිතුමා ද ජාත්‍යන්තරය හමුවේ ප්‍රකාශ කරන ලද්දේ විද්‍යුත් මාධ්‍ය උපයෝගී කර ගනිමින් ජනතාව අල්ලස හා දූෂණයට එරෙහිව බලගැන්වීම අත්‍යවශ්‍ය කරුණක් බවයි.

d. මේ සඳහා දැනට මුදල් අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතනයක් වන සැලසිනේ ආයතනයේ සහයෝගය ලබා ගැනීමට අපේක්ෂිත අතර රුපියල් මිලියන 540 ක් වැය වෙතැයි අපේක්ෂා කෙරේ.

## 06. පොදු මහජනතාවගේ සාමාන්‍ය මතය

a. පොදු මහජනතාවගේ සාමාන්‍ය මතය වන්නේ අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාවේ එකම කාර්ය භාරය වන්නේ කෙසේ හෝ යම් පුද්ගලයෙකු අත් අඩංගුවට ගෙන ඔහුට විරුද්ධව නඩුවක් පැවරිය යුතුය යන්නයි. කොමිෂන් සභාව විසින් විත්තිකරුවන්ට එරෙහි සාක්ෂි ප්‍රමාණවත් වන්නේ නම් අත්අඩංගුවට ගැනීම හා නඩු පැවරීම සිදු කරනු ලැබේ. මේ සම්බන්ධව පුළුල් අවබෝධයක් ජනතාවට නොමැති වීම මෙම කොමිෂන් සභාව මුහුණ දෙන ප්‍රබල අභියෝගයයි. වර්තමානයේ කොමිෂන් සභාව පරිවර්තීය යුගයකට පැමිණ සිටින්නේ අවුරුදු 25කට පසුව ස්ථිර අඩිතාලමක් හා පදනමක් යොදමින් අනාගතයේ කොමිෂන් සභාව ශක්තිමත් කරමින් අල්ලස හා දූෂණය අවම කළ රටක් බිහි කිරීම සඳහාය.

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව.**

**2018 ජනවාරි මස 01 වන දින සිට සැප්තැම්බර් මස 30 වන දින දක්වා ප්‍රගතිය.**

01. 2018.09.30 දිනට අධිකරණවල පැවරූ මුළු නඩු සංඛ්‍යාව - 35

### මහේස්ත්‍රාත් අධිකරණය

| අල්ලස් | දූෂණ | වත්කම්/බැරකම් හෙළි නොකිරීම | එකතුව |
|---|---|---|---|
| 04 | 02 | 07 | 13 |

වූදිතයින්

- හිටපු නීතිපති
- විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ හිටපු ලේකම්
- හිටපු ප්‍රදේශිය සභා මන්ත්‍රී (2)
- පොලිස් කොස්තාපල්
- කාර්යාල කාර්ය සහායක
- අභියාචනා අධිකරණ විනිසුරු
- හිටපු නගරාධිපති
- ග්‍රාම නිලධාරී
- පොලිස් ආරක්ෂක සහායක

### මහාධිකරණය

| අල්ලස් | අයුතු වත්කම් ඉපයීම | එකතුව |
|---|---|---|
| 19 | - | 19 |

වූදිතයින්

- විදුහල්පති
- මාර්ග සංවර්ධන අධිකාරියේ තාක්ෂණ නිලධාරී
- මහජන සෞඛ්‍ය පරීක්ෂක
- යුධ හමුදා සෙබළ
- සහකාර විකුණුම් කළමනාකරු
- පොලිස් කොස්තාපල් - 02
- සෞඛ්‍ය කාර්ය සහායක
- සිවිල් පුද්ගලයින් - 03
- විදුලි අධිකාරී
- කම්කරු නිලධාරී
- විදුලි ශිල්පී
- බිට්ටු වන නිලධාරී
- ගබඩා භාරකරු
- ග්‍රාම නිලධාරී
- කාර්යාල කාර්ය සහායක

## 02. 2018.09.30 දිනට සිදු කළ සාර්ථක අල්ලස් වැටලීම් සංඛ්‍යාව - 29

- එම වැටලීම්වලදී අත් අඩංගුවට ගත් සැකකරුවන් සංඛ්‍යාව - 32
- සැකකරුවන් -
  - ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී
  - විදුලි අධිකාරී
  - උප පොලිස් පරීක්ෂක
  - සහකාර පොලිස් අධිකාරී
  - සැලසුම් නිලධාරි
  - ජනපද නිලධාරි
  - සංවර්ධන නිලධාරි
  - කර්මාන්ත පරිපාලක
  - පොලිස් පරීක්ෂක (02)
  - පොලිස් සැරයන්
  - පොලිස් කොස්තාපල් -3
  - පුද්ගලික බස් රථ වේලා සටහන්කරු
  - සිවිල් පුද්ගලයින් (2)
  - සභාපති (රාජ්‍ය දැව සංස්ථාව)
  - ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු
  - කම්කරු නිලධාරි (02)
  - සහකාර නීති නිලධාරී
  - ජ්‍යෙෂ්ඨ කම්කරු නිලධාරි
  - සුරාබදු නියාමක
  - සමෘද්ධි සංවර්ධන නිලධාරී
  - කෘෂිකර්ම උපදේශක
  - බීට්ටු වන නිලධාරී
  - ග්‍රාම නිලධාරී
  - කාර්යාල කාර්ය සහායක
  - පුද්ගලික බස් නැවතුම්පලෙහි ස්ථානාධිපති
  - සුත්‍ර කම්වු සාමාජික

## 04. 2018.09.30 දිනට අධිකරණය විසින් අවසන් කරන ලද නඩු සංඛ්‍යාව - 92

මහේස්ත්‍රාත් අධිකරණය - 19

| | අල්ලස් | දූෂණ | වත්කම්/බැරකම් හෙළි නොකිරීම | එකතුව |
|---|---|---|---|---|
| වැරදිකරු | 03 | 01 | 13 | 17 |
| නිවැරදිකරු | 01 | - | - | - |

මහාධිකරණය - 73

| | අල්ලස් | අයුතු වත්කම් ඉපයීම | එකතුව |
|---|---|---|---|
| වැරදිකරු | 39 | 02 | 41 |
| නිවැරදිකරු | 28 | 01 | 29 |
| වෙනත්* | 04 | - | 04 |

*චූදිත මිය යාම/පැමිණිලිකරු මිය යාම හා ඉල්ලා අස්කර ගැනීම

## 01. පසුගිය වසරවල දී අධිකරණ මඟින් විත්තිකරුවන් වරදකරුවන් කිරීමට අදාළ සංඛ්‍යා ලේඛන.

| වර්ෂය | පැවරූ මුළු නඩු සංඛ්‍යාව | අවසන් කළ නඩු සංඛ්‍යාව | වරදකරුවන් ගණන |
|---|---|---|---|
| 2005 | 98 | 12 | 05 |
| 2006 | 110 | 20 | 07 |
| 2007 | 91 | 33 | 12 |
| 2008 | 63 | 20 | 14 |
| 2009 | 43 | 56 | 24 |
| 2010 | 67 | 38 | 17 |
| 2011 | 34 | 40 | 20 |
| 2012 | 77 | 60 | 33 |
| 2013 | 58 | 55 | 17 |
| 2014 | 64 | 58 | 22 |
| 2015 | 108 | 52 | 15 |
| 2016 | 87 | 34 | 15 |
| 2017 | 73 | 89 | 57 |
| 2018 | 35 | 92 | 59 |

### පසුගිය වසරවල දී අධිකරණ මඟින් විත්තිකරුවන් වරදකරුවන් කර ඇති ප්‍රමාණය

